# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,098 - 2018 නොවැම්බර් මස 16 වැනි සිකුරාදා - 2018.11.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 575 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 576 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 දෙසැම්බර් මස 07 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 නොවැම්බර් මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම -(104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ මාතර දිස්ත්‍රික්කයේ, වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් තුෂාරි පී. සූරියආරච්චි වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1984 ජූලි මස 30 වැනි දින ප්‍රදානය කර ඇති අංක මාතර/ප්‍ර/7297 දරණ ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන පෝරඹ කනංකෙ පදිංචි කළහෙ පාඩිකෝරළගේ ඇක්මන් වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO 381 යටතේ 1987.08.28 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උප ලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තික භාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2018.12.02 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

උපලේඛනය

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැලිගම් කෝරලේ පෝරඹ කනංකෙ උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පෝරඹ කනංකෙ නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද සර්වේසර් ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 14 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අ.ග.පි. 559 දරන පිඹුරේ අංක 739 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූද, ප්‍රමාණයෙන් රූඩ් 03 පර්චස් 26ක් විශාලත්වය ඇත්තා වූද පහත දක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : උඩුමුල්ලෙකැලේ

| | | |
|---|---|---|
| *උතුරට* | : | අ.ග.පි. 559 හි 777 සහ 779 කැබලි |
| *නැගෙනහිරට* | : | අ.ග.පි. 559 හි 779, 780, 788 කැබලි |
| *දකුණට* | : | අ.ග.පි. 559 හි 788, 790 කැබලි |
| *බස්නාහිරට* | : | අ.ග.පි. 559 හි 790, 84, 777 කැබලි |

තුෂාරි පී. සූරියආරච්චි,
ප්‍රාදේශීය ලේකම්,
වැලිපිටිය.

11-592

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :- 4/10/55702
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :- පීඑල්සී3031687

### 21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 163, දකුණු ගිලීමලේ ග්‍රාම නිලධාරි වසමේ රත්තුරුගල ගමේ රජයේ මිනින්දෝරු ඩී. එන්. පියරත්න මයා විසින් මැන වෙන්කර සකස් කරන ලද අංක 2010/110 දරන අනුරේඛනයේ කැබලි අංක ඒ සහ බී දරන ප්‍රමාණයෙන් හෙක්. 0.0383 කට අදාළව රජයේ ඉඩම් ආඥා පනත යටතේ වාණිජ කටයුතු සඳහා ඇක්සස් හයිඩ්‍රො පවර් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

කැබලි අංක ඒ (හෙක්. 0.0333)

| | | |
|---|---|---|
| *උතුරට* | : | ලොට් 105, |
| *නැගෙනහිරට* | : | ලොට් 146 (R/P), $116^A$ (R/P) සහ මෙහි B, |
| *දකුණට* | : | ලොට් 117 සහ 146 (R/P), |
| *බටහිරට* | : | ලොට් 146 (R/P). |

කැබලි අංක බී (හෙක්. 0.005)

| | | |
|---|---|---|
| *උතුරට* | : | ලොට් $116^A$ (R/P), |
| *නැගෙනහිරට* | : | මුරුතැන් ඇල, |
| *දකුණට* | : | ලොට් $116^A$ (R/P) සහ ලොට් 146 (R/P), |
| *බටහිරට* | : | මෙහි B සහ ලොට් 146 (R/P). |

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසි වලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

*(අ) බදු කාලය* . - අවුරුදු තිහයි. (30) (2018.08.09 සිට ඉදිරියට)

*වාර්ෂික බදු මුදල*.- බද්ද ක්‍රියාත්මක වන 2018 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන වන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂක බදු මුදලට 20%ක් එකතු විය යුතුය.

*වාර මුදල*.- වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* පළාත් ඉඩම් කොමසාරිස්, ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඉ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමා තුළ අසමත් වූ විටක බදු දීම අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2018.08.09 දින සිට අවුරුදු 05ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම කළ නොහැක.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය *ගැසට් පත්‍රය* පළ කරන දින සිට සති 06ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

පුබුදි ප්‍රේමදාස,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.

2018 නොවැම්බර් මස 16 වැනි දින,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

11-762

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :- 4/10/34773
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :- LC/L2/3031668

## 21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙහෙනකන්ද 164 එෆ් ග්‍රාම නිලධාරී වසමේ පහලගම ගමේ අංක R/RTN/2014/355/LS අනුරේඛනයේ දක්වා ඇති කැබලි අංක B, C, D, E, F, J, M සහ N දරන ප්‍රමාණයෙන් හෙක්. 0.4132කට අදාළව රජයේ ඉඩම් ආඥාපනත යටතේ වාණිජ කටයුතු සඳහා එකෝ ප්‍රෙන්ඩ්ලි පවර් ඩිවලොපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

කැබලි අංක B (හෙක්. 0.0374)
*උතුරට* : කැබලි අංක 98 1/2, $64^{A}$ සහ කට්ටි අංක A,
*නැගෙනහිරට* : කට්ටි අංක A සහ කැබලි අංක $64^{A}$, 98 1/2,
*දකුණට* : කැබලි අංක 98 1/2 සහ 98 2/2,
*බටහිරට* : කැබලි අංක D, C කැබලි අංක 93 සහ 98 1/2.

කැබලි අංක C (හෙක්. 0.0008)
*උතුරට* : කැබලි අංක 93 සහ 98 1/2,
*නැගෙනහිරට* : කට්ටි අංක B,
*දකුණට* : කට්ටි අංක D,
*බටහිරට* : කැබලි අංක 98 2/2 සහ 93.

කැබලි අංක D (හෙක්. 0.0297)
*උතුරට* : කැබලි අංක 98 2/2 සහ කැබලි අක්ෂර C,
*නැගෙනහිරට* : කට්ටි අංක B, කැබලි අංක 98 1/2 සහ 98 2/2,
*දකුණට* : කැබලි අංක 98 2/2, 99 සහ කට්ටි අංක E,
*බටහිරට* : කට්ටි අංක E, කැබලි අංක 99 සහ 98 2/2.

කැබලි අංක E (හෙක්. 0.0535)
*උතුරට* : කැබලි අංක 99, 98 2/2 සහ කට්ටි අංක D,
*නැගෙනහිරට* : කට්ටි අංක D, කැබලි අංක 98 2/2 සහ 99,
*දකුණට* : කැබලි අංක 99, $64^{A}$ සහ කට්ටි අංක G සහ F,
*බටහිරට* : කට්ටි අංක F, කැබලි අංක 103 සහ 99.

කැබලි අංක F (හෙක්. 0.0004)
*උතුරට* : කැබලි අංක 103,
*නැගෙනහිරට* : කැබලි අංක 99 සහ කට්ටි අංක E,
*දකුණට* : කට්ටි අංක G,
*බටහිරට* : කැබලි අංක 103.

කැබලි අංක J (හෙක්. 0.0020)
*උතුරට* : කැබලි අංක 105 2/2 සහ 66,
*නැගෙනහිරට* : කැබලි අංක 66 සහ කට්ටි අංක K,
*දකුණට* : කට්ටි අංක K, සහ කැබලි අංක $83^{F}$,
*බටහිරට* : කැබලි අංක 105 2/2.

කැබලි අංක M (හෙක්. 0.0471)

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 111, 83F, සහ කට්ටි අංක K, |
| *නැගෙනහිරට* | : | කට්ටි අංක K, |
| *දකුණට* | : | කට්ටි අංක N, සහ කැබලි අංක 120, |
| බටහිරට | : | කැබලි අංක 111. |

කැබලි අංක N (හෙක්. 0.2423)

| | | |
|---|---|---|
| උතුරට | : | කැබලි අංක 120, 111, කට්ටි අංක M සහ K, |
| නැගෙනහිරට | : | කට්ටි අංක K, |
| දකුණට | : | කැබලි අංක 83F , 121, 122 සහ 120 |
| බටහිරට | : | කැබලි අංක 120 සහ 123 |

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසි වලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(*අ*) *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2018.06.20 වැනි දින සිට ඉදිරියට)

*වාර්ෂික බදු මුදල* : බද්ද ක්‍රියාත්මක වන 2018 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන වන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂක බදු මුදලට 20%ක් එකතු විය යුතුය.

*වාර මුදල* .- වාර මුදලක් අය නොකෙරේ.

(*ආ*) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

(*ඇ*) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

(ඈ) පළාත් ඉඩම් කොමසාරිස්, ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතුය.

(ඉ) සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණු සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමා තුළ අසමත් වූ විටක බදු දීම අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(උ) 2018.06.20 දින සිට අවුරුදු 05ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම කළ නොහැක.

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය *ගැසට් පත්‍රය* පළ කරන දින සිට සති 06ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

පුබුදි ප්‍රේමදාස,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2018 නොවැම්බර් මස 16 වැනි දින,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

11-763